සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

88 S I

**10 ශ්‍රේණිය** | **නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකයඃ

**සැලකිය යුතුයි :**

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01. A4 කඩදාසියක සම්මත දිග, පළල සඳහන් පිළිතුර කවරක්ද?
    (i) 1188mm×841mm (ii) 37mm×26mm
    (iii) 420mm×297mm (iv) 297mm×210mm

02. 12cm ක් දිග රේඛාවක් 3:4:5 අනුපාතයට බෙදීමේ දී අත්‍යවශ්‍යම උපකරණ ඇතුළත් වරණය තෝරන්න, ,
    (i) පැන්සල, විහිත චතුරස්‍රය, කෝදුව
    (ii) කවකටුව, පැන්සල, කෝදුව
    (iii) මිනුම් කෝදුව, කවකටුව, විහිත චතුරස්‍රය
    (iv) කෝදු දෙකක්, පැන්සල

03. රූපයේ දැක්වෙන කේතුව A-A රේඛාව ඔස්සේ ඡේදනය කළ විට ලැබෙන තල රූපය වන්නේ.
    (i) වෘත්තයකි
    (ii) ඉලිප්සයකි
    (iii) බහුවලයකි
    (iv) පරාවලය




04. යම්කිසි දිගක් කෙටිකර ඇඳ පෙන්වීමට යොදා ගන්නා සංකේතාත්මක රේඛා කොටස මින් කුමක්ද?
    (i)  (ii) 
    (iii)  (iv) 

05. වෘත්තයක දිගින් වැඩිම හා පරිධියේ ලක්ෂ්‍ය දෙකක් ස්පර්ශ කරන සරල රේඛාව හඳුන්වන නම කුමක්ද?
    (i) ජ්‍යාය (ii) අරය (iii) චාපය (iv) විශ්කම්භය

06. ආසන්න වශයෙන් වෘත්තයක පරිධිය විශ්කම්භය මෙන් කී ගුණයක්ද?
    (I) තුන් ගුණයකි (ii) දෙගුණයකි (iii) සිව් ගුණයකි (iv) හත් ගුණයකි

07. මධ්‍ය ලක්ෂයේ සිට සමාන දුරකින් ගමන් ගන්නා තවත් ලක්ෂ්‍යයක ගමන් මාර්ගය හැඳින්වීමට යොදාගත හැකි නමකි,
    (i) වක්‍ර රේඛාවකි (ii) ආනත රේඛාවකි
    (iii) සරල රේඛාවකි (iv) සමාන්තර රේඛාවකි

08. පහත රූපයෙන් දක්වා ඇත්තේ,




(i) බාහිරව පිහිටි ලක්ෂ්‍යයක සිට වෘත්තයකට ස්පර්ශකය ඇඳීම.

(ii) වෘත්ත පරිධියේ සිට ලක්ෂ්‍යයකට ස්පර්ශකයක් ඇඳීම.

(iii) කුඩා වෘත්තයකට ස්පර්ශකයක් ඇඳීම.

(iv) රේඛාවක් සමාන කොටස් දෙකකට බෙදීම.

09. පහත දැක්වෙන ලෝහ වර්ග අතුරින් භංගුරතාවය අධික ලෝහ වර්ගය කුමක් ද?

(i) ඊයම් (ii) චීනච්චට්ටි (iii) පිත්තල (iv) වානේ

10. පහත දැක්වෙන දැව වර්ග අතුරින් කොන්ක්‍රීට් හැඩයම්, පෙට්ටි සෑදීමට වඩාත් සුදුසු දැව වර්ගයන් වන්නේ,

(I) තේක්ක, කැන්ද (ii) ගිණිසපු, කැන්ද (iii) මී, දොඹ (iv) අඹ, මහෝගනී

11. රාජ්‍ය දැව සංස්ථාවේ දැව වර්ගීකරණයට අනුව නියමිත දැව ශ්‍රේණි ගණන කීයද?

(i) 04 යි (ii) 06 යි (iii) 02 යි (iv) 08 යි

12. යාන්ත්‍රික ගුණ නිවැරදිව ගළපා නොමැති පිළිතුර වන්නේ,

(I) ප්‍රත්‍යස්ථතාව, දුස්ස්‍රාවීයතාවය (ii) දෘඩිබව, තන්‍යතාවය

(iii) ආතතිය, සම්පීඩනය (iv) භංගුරතාව, විලයනීතාවය

13. පහත දැක්වෙන දැව වර්ග අතුරින් ගෘහ භාණ්ඩ තැනීමට වඩාත් උචිතම දැව වර්ගය මින් කුමක්ද?

(I) රුක්අත්තන (ii) හල්මිල්ල (iii) කොස් (iv) කොහොඹ

14. අංශක $90^0$ හැරවුමක් නිර්මාණය කිරීමට භාවිතයට ගත හැකි අනුපාතයන් වන්නේ,

(I) 3:4:5 අනුපාතය (ii) 2:4:5 අනුපාතය (iii) 4:8:16 අනුපාතය (iv) 5:3:2 අනුපාතය

15. කපරාරු කිරීමේදී යොදා නොගන්නා උපකරණයක් වන්නේ මින් කුමක්ද?

(I) වරක්කලය (ii) ලඹකැටය (iii) මනිස් ලෑල්ල (iv) මුළු මට්ටම

16. ඉදිකිරීම් වැඩබිමකදී සිමෙන්ති හා සමාහාරක මැන ගැනීම සඳහා ශ්‍රමිකයන් භාවිතා කරන සම්මත උපකරණ කුමක්ද?,

(i) තාච්චිය (ii) බාල්දිය (iii) මිනුම් පෙට්ටිය (iv) සවල

17. බඩගල් බැම්මක දිග අතට සමාන්තරව යෙදෙන බදාම කුස්තුර වර්ගය හඳුන්වන නම කුමක්ද?

(i) සිරස් කුස්තුර (ii) පැන්නුම් කුස්තුර (iii) වරි කුස්තුර (iv) හෝණ කුස්තුර

18. ඉතා කුඩා යාන්ත්‍රික උපකරණයක සැලැස්ම නිවැරදිව පරිමාණයට අඳින ක්‍රමය විය යුත්තේ,

(i) එම පරිමාණයටම ඇඳීම (ii) විශාල කර ඇඳීම

(iii) කුඩා කර ඇඳීම (iv) පරිමාණ දෙකකට ඇඳීම

19. මැටි ගඩොල් නිපදවීමට යොදා ගන්නා පස්වල තිබිය යුතු ප්‍රධාන සංඝටක වන්නේ,

(i) ඇලුමිනා හා සිලිකා (ii) ඇලුමිනා හා පොටෑස්

(iii) පොස්පරස් හා සිලිකා (iv) ඉහත කිසිවක් අයත් නොවේ.

20. ගඩොල් නිපදවීම සඳහා සුදුසු පස්වල තිබිය යුතු වැලි සංයුතිය නිවැරදිව සඳහන්ව ඇත්තේ,
(i) 30% - 50% (ii) 20% - 30% (iii) 10% - 20% (iv) 40% - 50%

21. වැරගැන්නුම් සහිත කොන්ක්‍රීටයක් සඳහා භාවිතයට වඩාත් සුදුසු මිශ්‍රණ අනුපාතය මින් කුමක්ද?
(I) 1:3:6 අනුපාතය (ii) 1:1½:2 අනුපාතය (iii) 1:1½:3 අනුපාතය (iv) 1:2:4 අනුපාතය

22. ශාකයක ඇටුවම යන දැව දෝෂය,
(i) මූල පද්ධතියේ හට ගනියි. (ii) ශාක කඳ මධ්‍යයේ හට ගනියි.
(iii) ශාක කඳක මුල් කොටසේ හට ගනියි. (iv) ශාක කඳක ඕනෑම තැනක හට ගත හැකිය.

23. දිය ගැසූ හුණු නිෂ්පාදනය කරගනු ලබන්නේ,
(I) අළුහුණුවලට ජලය එක්කර ගැනීමෙන්ය (ii) හුණුගල් එළිමහනේ පුළුස්සා ගැනීමෙන්ය
(iii) අළුහුණුවලට සිමෙන්ති මිශ්‍ර කර ගැනීමෙන්ය (iv) අළුහුණු වැලි, ජලය සමඟ මිශ්‍රකර ගැනීමෙන්ය

24. රාජ්‍ය දැව සංස්ථාවේ වර්ගීකරණය අනුව බුරුත හල්මිල්ල හා මහෝගනී ආදී දැව වර්ග අයත් වන්නේ,
(i) සුපිරි සුඛෝපභෝගී පන්තියටය. (ii) පළමු පන්තියටය.
(iii) සුඛෝපභෝගී පන්තියටය. (iv) විශේෂ ඉහළ පන්තියටය.

25. ශාක කඳක් පරිවර්තනය කිරීමෙන් ලබා ගන්නා දැව හැඳින්වෙන්නේ,
(i) කෘත්‍රිම දැව නමිනි. (ii) ස්වභාවික දැව නමිනි.
(iii) සකස් කරගත් දැව නමිනි. (iv) නිෂ්පාදිත දැව නමිනි.

26. කොන්ක්‍රීට් යාන්ත්‍රිකව සුසංහසනය කිරීමේදී උපයෝගී කර නොගන්නා කම්පක වර්ගය කුමක්ද?
(i) පෙවුම් කම්පකය (ii) පෘෂ්ඨ කම්පකය (iii) හැඩයම් කම්පකය (iv)තල කම්පකය

27. යම් ද්‍රව්‍යයකට තාපය ලබා දීමෙන් එම ද්‍රව්‍යය ද්‍රව බවට පත් කිරීමට ඇති හැකියාව,
(I) සුවිකාර්යතාවය යි. (ii) භංගුරතාවය යි. (iii) විලයනීතාවය යි. (iv) ප්‍රත්‍යාස්ථතාවය යි.

28. කේතුවක් ඇළ උසට සමාන්තරව කැපීමෙන් ලැබෙන වක්‍රය හඳුන්වනු ලබන්නේ,
(I) වෘත්තය නමිනි. (ii) පරාවලය නමිනි.
(iii) ඉලිප්සය නමිනි. (iv) අණ්ඩාකාර වෘත්තය නමිනි.

29. සම්මත මට්ටමේ බැහුම් කේතුවේ මුදුන, පතුල හා උස පිළිවෙලින් දක්වා ඇත්තේ,
(i) 100 mm, 200mm, 300mm (ii) 75 mm, 100mm, 175mm
(iii) 200 mm, 225mm, 300mm (iv) 125 mm, 225mm, 325mm

30. ඉස්කුරුප්පු ඇණයක රූප සටහනක් පහත දක්වේ. එහි A ලෙස නම් කර ඇත්තේ,
(i) ඇණ හිස (ii) ඇණ කඳ (iii) අන්තරාලය, (iv)ඇණ කට්ටය




31. භූමියේ විශාල ප්‍රදේශයක් ඉතා පහසුවෙන් මට්ටම් කර ගැනීමට යොදා ගතහැකි වඩාත්ම සුදුසු මට්ටම් උපකරණයක් වන්නේ කුමක්ද?
(I) තියඩොලයිට්ටුව (ii) ස්ප්‍රිතු ලෙවලය (iii) ලෙවල් බටය (iv) කුස්තානම

32. ආවුද උපකරණ සහ යන්ත්‍ර කොටස් ස්නේහනය කිරීමෙන් අප බලාපොරොත්තු නොවන කාර්යය වන්නේ,

(i) ඝර්ෂණය වැඩි කිරීම. (ii) කාර්යක්ෂම වීම

(iii) ක්‍රියාකාරීත්වය සුමටවීම (iv) උපාංග ගෙවී යාම අවම වීම

33. වර්තමානයේ භාවිතයට ගන්නා සම්මත ගඩොලක (SLS) ප්‍රමිතියට අනුව ප්‍රමාණය වන්නේ,

(i) 220×105×65 mm (ii) 215×105×65 mm

(iii) 65×105×220 mm (iv) 215×102.5×65 mm

34. දැව ඉරීමේදී වැඩි ආයාසයක් දැරිය යුතු දැව වර්ගය කුමක්ද?

(I) කැන්ද (ii) බුරුත (iii) ගිනිසපු (iv) අඹ

35. දැව පදම් කරන ප්‍රධාන ක්‍රම,

(i) 02 ක්ය (ii) 03 ක්ය (iii) 04 ක්ය (iv) 05 ක්ය

36. මෙම රූපයේ දක්වා ඇති දැව දෝෂය වන්නේ,

(i) අරටු පලුද්ද

(ii) වට පලුද්ද

(iii) අඩවට පලුද්ද

(iv) තරු පලුද්ද



37. ඇලුමිනියම් මිශ්‍ර ලෝහයේ පවතින ගුණයක් නොවන්නේ මින් කුමක්ද?

(I) ශක්තිමත් බව (ii) දෘඩබව

(iii) තන්‍යතාවය (iv) භංගුරතාවය

38. සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති බෑගයක අඩංගු සිමෙන්ති ප්‍රමාණය නිවැරදිව දක්වා ඇත්තේ,

(i) 50 kg (ii) 65 kg (iii) 25 kg (iv) 10 kg

39. කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම සඳහා යොදා ගන්නා ජලයේ තිබිය යුතු ලක්ෂණයක් වන්නේ,

(i) මඩ සහිත දුඹුරු පාට ජලය විය යුතුය.

(ii) ලවණ ප්‍රතිශතය ඉහළ ජලය විය යුතුය.

(iii) වැලි සහිතව ගලායන ජලය විය යුතුය.

(iv) බීමට තරම් සුදුසු ජලය විය යුතුය.

40. මීටර කෝදුවක තිබිය යුතු දිග මිලිමීටර්වලින් නිවැරදිව දක්වා ඇත්තේ,

(i) 3000 mm (ii) 1100 mm (iii) 1000 mm (iv) 1250 mm

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

88 S I

**10 ශ්‍රේණිය** | **නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය - II** | කාලය පැය 02 යි
අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි

නම/ විභාග අංකයඃ

සැලකිය යුතු :-
- පළමුවන ප්‍රශ්නය සහ තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්ණ පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්ණයට ලකුණු 20 ක් ද තෝරා ගනු ලබන එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

01. (i) අරය 25 mm වූ වෘත්තයක් තුළ සවිධි පංචාස්‍රයක් නිර්මාණය කරන්න. (ලකුණු 15)

(ii) විශ්කම්භය 6 cm ක් වන සවිධි ෂඩාස්‍රයක් නිර්මාණය කරන්න. (ලකුණු 05)

02. (i) ද්‍රව්‍යවල පවත්නා භෞතික ගුණ 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් ද්‍රව්‍යවල පවත්නා ගුණ වරහන් තුළින් තෝරා නිවැරදිව වගුගත කරන්න.
(විද්‍යුත් සන්නායකතාවය, විශිෂ්ඨ තාපය, ද්‍රවාංකය, තාපාංකය, ප්‍රසාරණය, තාපීය ධාරිතාව, විද්‍යුත් ප්‍රතිරෝධීතාවය) (ලකුණු 03)

| රසායන ගුණ | තාපීය ගුණ | විද්‍යුත් ගුණ |
|---|---|---|
| | | |

(iii) ද්‍රව්‍යවල පවත්නා යාන්ත්‍රික ගුණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

03. ඉදිකිරීම් සඳහා කොන්ක්‍රීට් භාවිතය වර්තමානය තුළ බහුලව දැකිය හැක.

(i) කොන්ක්‍රීට් සුසංහසනය යනු කුමක්ද? (ලකුණු 02)

(ii) කොන්ක්‍රීට්වල ඇතිවන දෝෂ 03ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) මහල් නිවාස ඉදිකිරීමේදී යොදන කොන්ක්‍රීට් පුවරුවක් (Slab) පදම් කර ගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

04. ''යම් කාර්යයක් කිරීමේදී ආරක්ෂාවට ප්‍රථමස්ථානය ලබා දිය යුතුය.''

(i) අනතුරු ඇතිවීමට බලපාන සාධක දෙකක් ලියන්න. (ලකුණු 03)

(ii) ආරක්ෂක පූර්වෝපාය යනුවෙන් කුමක් අදහස් වේද? (ලකුණු 02)

(iii) කාර්යයක් කිරීමේදී ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.(ල. 05)

05. (i) ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වේගවත් දියුණුව සඳහා බලපාන ලද හේතු 03 ක් ලියන්න. (ලකුණු 05)

(ii) ලංකාවේ අතීත ඉදිකිරීම් තුළ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) වර්තමානයේ ඉදිකිරීම් කටයුතුවලදී භූමිය ප්‍රමාණවත් නොවීම පිළිබඳව ගැටලුව විසඳීමට යොදා ගත හැකි ක්‍රියාමාර්ග උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 04)

06. ''ඈත අතීතයේ සිට ඉදිකිරීම් කටයුතු සඳහා ගඩොල් භාවිතා කොට ඇත.''

(i) ගඩොල් නිපදවීමට ගන්නා මැටිවල ඇති ප්‍රධාන සංඝටක 02 කුමක්ද? (ලකුණු 02)

(ii) ගඩොල් සඳහා භාවිතා කළ හැකි ආදේශක වර්ග 02 ක් ලියන්න. (ලකුණු 02)

(iii) ගඩොල්වල දැකිය හැකි දෝෂ 03ක් නම් කරන්න. (ලකුණු 05)

(iv) ගඩොල් නිපදවීමේ පියවර නම් කරන්න. (ලකුණු 05)

07. ''යම් කාර්යයක් කිරීමේදී එය පහසු කර ගැනීම සඳහා ආවුද හා උපකරණ භාවිතා කරයි.''

(i) භාවිතයෙන් ඉවත් වෙමින් පවතින ආවුද හා උපකරණ 03ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) ආවුද හා උපකරණ භාවිතයේදී පිරිවිතර පිළිබඳ සැලකිලිමත් වීමෙන් ලැබෙන වාසි මොනවාද? (ලකුණු 02)

(iii) මුවහත් තැබීමේ ආවුද හා උපකරණ 04ක් ලියන්න. ඉන් එකක පැහැදිලි රූප සටහනක් අඳින්න (ලකුණු 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (4) | 11 - (4) | 21 - (4) | 31 - (1) |
| 2 - (3) | 12 - (1) | 22 - (3) | 32 - (1) |
| 3 - (1) | 13 - (4) | 23 - (1) | 33 - (1) |
| 4 - (2) | 14 - (1) | 24 - (3) | 34 - (2) |
| 5 - (4) | 15 - (1) | 25 - (2) | 35 - (2) |
| 6 - (1) | 16 - (3) | 26 - (4) | 36 - (1) |
| 7 - (1) | 17 - (4) | 27 - (3) | 37 - (4) |
| 8 - (1) | 18 - (2) | 28 - (2) | 38 - (1) |
| 9 - (2) | 19 - (1) | 29 - (1) | 39 - (4) |
| 10 - (2) | 20 - (2) | 30 - (1) | 40 - (3) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

## පිළිතුරු පත්‍රය - II කොටස

(01) I.




තෝරාගත් නිර්ණායක මත ලකුණු ලබා දෙන්න. ලකුණු 15

ii. නිවැරදිව නිර්මාණය කර ඇති රූපසටහන් සඳහා ලකුණු ලබා දෙන්න. (ල. 05)

(02) i. බර, ස්කන්ධය, ඝනත්වය

ii.

| විද්‍යුත් ගුණ | තාපීය ගුණ | රසායනික ගුණ |
|---|---|---|
| * විද්‍යුත් සන්නායකතාවය | * විශිෂ්ඨ තාපය, තාපීය ධාරිතාව | * ද්‍රවාංකය |
| * විද්‍යුත් ප්‍රතිවිරෝධිතාවය | * ප්‍රසාරණය | * තාපාංකය |

iii. ආතතිය, සම්පීඩනය, හංගුරතාවය, දෘඩිබව විස්තර කර තිබිය යුතුය.

## පිළිතුරු - ඉතිරි කොටස

(03) I. කොන්ක්‍රීට් මිශ්‍රණය තුළ සිර වී ඇති වාතය ඉවත් කර මිශ්‍රණ අංශු හොඳින් තැන්පත් කිරීමයි.

ii. වර්ණය වෙනස් වීම
දූවිලි මතු වීම
පතුරු ගැලවීම

iii. ජලය රඳවා තබා ගැනීම
තෙත ගෝණි ආවරණය
තෙත වැලි ආවරණය යෙදීම
ආදිය සඳහා කරුණු විස්තර කර තිබීම.

(04) i. ගින්න, ආලෝක කිරණ, යාන්ත්‍රික දෝෂ

ii පුද්ගල ආරක්ෂාව හා උපකරණවල ආරක්ෂාව සඳහා ගන්නා ක්‍රියාමාර්ග දක්වා තිබීම.

iii වැඩකරන විට හොඳ මානසිකත්වයත්, ශාරීරික යෝග්‍යතාවයත් තිබීම.
දෝෂ සහිත උපකරණ භාවිතා නොකිරීම.
අනතුරු ඇතිවන සේ උපකරණ ආවරණය නොකිරීම.
වැඩකරන විට ඉඩ ඇතිව සිටීම.
වැඩකරන ස්ථානයට හොඳින් ආලෝකය ලැබෙන සේ පරිසරය සකස් කිරීම.

05. i නව තාක්ෂණය පදනම් වීම.
ලෝහ නිෂ්පාදන යොදා ගැනීම.
ඉදිකිරීම් ආදේශක භාවිතය.
වීදුරු, ප්ලාස්ටික්

ii මැටි ගඩොල් භාවිතය, ශක්තිමත් කපරාරු ක්‍රම සහ ඉතා තද දැව වර්ග භාවිතය

iii තට්ටු නිවාස ඉදිකිරීම, භූමිය යට ඉදිකිරීම් සිදුකිරීම සහ මුහුදමත ඉදිකිරීම් (මුහුද ගොඩකර)

06. i ඇලුමිනා, සිලිකා

ii සිමෙන්ති පස් මිශ්‍ර සම්පීඩිත ගඩොල්
සිමෙන්ති ගඩොල්,
කොහුකෙඳි ආශ්‍රිත ගඩොල් ,
සම්පීඩිත සිමෙන්ති ගඩොල්

iii පලුදු සහිත ගඩොල්
ආස්තරික ගඩොල්

iv ගඩොල් නිපදවීමේ පියවර පිළිවෙලට සඳහන් විය යුතුය.

07. I අවගාරය, රැචට්, බුරුමය

ii කාර්යක්ෂමතාවය වැඩි කිරීම,
ප්‍රායෝගික වීම,
වියදම් අඩුවීම.

iii පීරි වර්ග, වැලිගල , තෙල් බඳුන, තෙත්නියම් අඬු